# නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම (10 ශ්‍රේණිය)

| කෘතියේ/නිර්මාණයේ නම | කතුවරයා | ලියැවුණු කාලය |
|---|---|---|
| 01. පන්සිය පනස් ජාතක පොත (උම්මග්ග ජාතකය) | අඥාතයි | කුරුණෑගල අවධිය |
| 02. ගුත්තිල කාව්‍යය | වෑත්තෑවේ හිමි | කෝට්ටේ අවධිය |
| 03. ජනකවි (හානා හීය පානා අඬහැරෙන් දැනේ | අඥාතයි | අඥාතයි |
| 04. බැද්දේගම (09 පරිච්ඡේදය) | ලෙනාඩ් වුල්ෆ් (පරිවර්තනය - ඒ. පී. ගුණරත්න) | නූතන අවධිය |
| 05. ජාතික තොටිල්ල | එස්. මහින්ද හිමි | නූතන අවධිය |
| 06 ගංගාවේ සංගීතය | එච්. එම්. කුඩලිගම | නූතන අවධිය |
| 07. සිංහබාහු (දෙවන අංකය) | එදිරිවීර සරච්චන්ද්‍ර | නූතන අවධිය |

## 01සතර කන් මන්ත්‍රණය (කුරුණෑගල අවධිය)

- **පන්සිය පනස් ජාතක පොත 14** වන සියවසෙහි **කුරුණෑගල** රජ කළ **සතර වන පණ්ඩිත පරාක්‍රමබාහු** රජ දවස **වීරසිංහ ප්‍රතිරාජ** නමැති ඇමැතිවරයාගේ අනුග්‍රහයෙන් සිංහලයට නගා ඇති බව කියැවේ.
- මේ සඳහා මූලාශ්‍රය කොට ගත් ග්‍රන්ථය වන්නේ **පාලි ජාතකට්ඨ** කථාවයි.
- පන්සිය පනස් ජාතක කතා පොත ලෙස හැඳින්වුව ද එහි සැබවින් ම ඇත්තේ ජාතක කතා **547**කි.
- සිංහල ජාතක කතාවන්ට නියමිත ආකෘතියක් දක්නට ඇත. ඒ අනුව,**වර්තමාන කතාව, අතීත කතාව, සමෝධානය** යන ලක්ෂණ, සිංහල ජාතක කතාව තුළ දක්නට ලැබෙන අංග යි.
- ජාතක පොත සිංහලයට නැගුණු පසු ව ද වෙන් වෙන් වශයෙන් ජාතක කතා ලියැවී ඇත. **උම්මග්ග ජාතකය, එළු උමංදාව, උම්මදන්ති ජාතකය** එබඳු ග්‍රන්ථ කිපයකි.
- **මුවදෙව්දාවත, සසදාවත** හා **කව්සිළුමිණ** ජාතක කතා ඇසුරෙන් රචිත ගී කාව්‍යයි.
- **කාව්‍යශේඛරය, ගුත්තිල කාව්‍යය, සඳකිඳුරු දා කව, කුස ජාතක කාව්‍යය, දහම් සො' දා කව, වෙස්සන්තර ජාතකය, මුව ජාතකය, නිමි ජාතකය, කව්මි, කොළොල, කව්මි, මල් දම** ආදිය ද ජාතක පොත ඇසුරෙන් බිහි වූ කාව්‍ය ග්‍රන්ථයි.
- උම්මග්ග ජාතකය රචනා කිරීමේ අරමුණ වී ඇත්තේ **මහෞෂධ පඬිතුමාගේ බුද්ධි මහිමය** ප්‍රකාශ කිරීමයි.
- ජාතක කතා අතර **දීර්ඝතම** කතාවයි.
- උම්මග්ග ජාතකයේ එන සතර **කන් මන්ත්‍රණයේ** සිට **ධර්ම යුද්ධය** දක්වා මෙම පාඩමට ඇතුළත් වේ.
- පෙළෙහි **අර්ථය ලිහිල් බසින්** ලියයි.
- නිර්මාණාත්මක භාෂා භාවිතය/නාට්‍යානුරූපී දෙබස්/කෙටි වැකි/උපමා, රූපක ආදී කාව්‍යාලංකාර/චරිත නිරූපණය/අවස්ථා හා සිද්ධි නිරූපණය/උපහාස, හාස්‍ය ආදී විවිධ රස ජනනය **විචාරයේ යෙදීම.**

**1) තුමූ අලුයම් වේලෙහි පිබිද, සුවඳ තෙලෙහි නගන ලද පහන් ආලෝකයෙන් ගන්ධදාම පුෂ්පදාමාවලම්බිත නා නා වර්ණ විචිත්‍ර විතානෝපලක්ෂිත අලංකෘත ශ්‍රී යහන් ගර්භය බලන්නාහ**

**2) සාල්ලෙක ලාලා පාතට බාත කෙනකුන් මෙන් කේවට්ට බමුණා හිසැ වර්චස් පිඩක් හෙළා, කිමෙක් දැයි කට දල්වා ගෙන උඩ බැලූ තැනැත්තවුන්ගේ මුඛයේ නැවැත වර්චස් පිඩක් හෙළා,**

**3) රෝගයෙන් පෙළෙන එකක් හට අවස්ථා පිළියමක් දන්නා වෙදකු පිළිසරණ වන්නා සේ ද සා දුකින් පෙළෙන එකකුට භෝජනය මුත් අනෙකක් පිළිසරණ නොවන්නා සේ ද පිපාසා ඇති එකකුට පැන් පුවා හොත් මුත් ඒ පිපාසය නොසන්සිඳෙන්නා සේ ද**

**4) නුවරට වැද, ගැල් පුරා ගෙනවුත් කොමඩු බානා සේ මහා ජනයා ඉස් කපා ගනුව වේදේහ රජහු ඉසත් වහා**
**ගෙනෙවමයි කීහ.**

**5) කීප දවසක් පැන් නවතා ලන්නා පැන් තොලදින් ක්ලාන්ත වූවාහු දොර ඇර පියන්නාහ. වී සාල් වැද්ද නො දෙම්හ. බතින් පීඩිත වූ මනුෂ්‍යයෝ දොර හැර පියන්නාහ. දර නවතා ලා නුවර ඇර ගනුම්හමයි කීයේ ය.**

# 2.ගුත්තිල වෙණ නද (කෝට්ටේ අවධිය)

- **ගුත්තිල කාව්‍යය** රචනා කරනු ලැබුවේ වැත්තැවේ හිමියන් විසිනි.
- **පද 511කින්** සමන්විත ගුත්තිල කාව්‍යය **ගුත්තිල ජාතකය** ඇසුරෙන් නිර්මාණය වූවකි.
- ගුත්තිල කාව්‍යය රචනා කරන ලෙස ආරාධනය කරනු ලැබුවේ **සිරි පැරකුම්බා රජුට** සේවය කළ අගමැතිවරයෙකු වූ **සලාවත ජයපාල** මැතිඳුන් විසිනි.
- වැත්තැවේ හාමුදුරුවෝ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ ගෝලයෙක් වූහ.
- ගුත්තිල කාව්‍යයට **පාදක වූ කථා වස්තුව** සැකෙවින්
- වැත්තැවේ හිමි තම කාව්‍ය සංග්‍රහය නිර්මාණය කිරීමට හේතු වූ සිදුවීම පිළිබඳ **ප්‍රකට ජනප්‍රවාදය**
- ලඝු අකුරු දෙකක් හා ගුරු අකුරකින් යුතු **වායු ගණයෙන්** කාව්‍යය ආරම්භකලේ ද එහි අනිෂ්ට විපාක දැන දැන ම බව ජනප්‍රවාදයේ එයි.

සිය පින් සිරින් සරු
දෙතිස් ලකුණෙන් විසිතුරු
කෙලෙසුන් කෙරෙන් දුරු
වදිම් මුනි උතුමන් තිලෝගුරු

- නිර්දිෂ්ට කවි පෙළ කියවා අර්ථය **ලිහිල් බසින්** ලියයි.
- විස්තර කෙරෙන අවස්ථාව/කවියාගේ අරමුණ/කවියා අනුගමනය කළ රචනා සම්ප්‍රදාය/සංකල්ප රූප ජනනය /කාව්‍යමය බස් වහර/උපමා, රූපක ආදි කාව්‍ය උපක්‍රම භාවිතය **විචාරයේ යෙදීම.**

**1) නො දන ම තමා බල**
**සබයට අවුත් නො පැකිළ**
**වැඳ රද පද කමල**
**දෙසෙක මුසිලයා ද උන් කල**

**2) දෙ වැනි තුන් වැනි තත**
**සතර වැනි පස් වැනි තත**
**ස වැනි සත් වැනි තත**
**මෙ සේ සිඳි සඳ මෙ අප බෝසත**

**3) දිය දිය ගොස පල කෙරෙමින් සපැමිණී**
**ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණී**
**ගිය ගිය දිය නද එන මෙන් ගෙන මිණී**
**සිය සිය ගුණයෙන් වෙණ නද නික් මිණී**

**4) සතොස් කරන වීණා නද ඇසුමට**
**නාගොස් සිටින පිල්බර ගණ ගොදුරට**
**වෙසෙස් රුචින් තම මැවුවත් බඹහට**
**සඳැස් සවන් නොකලෑ යි වූ නොසතුට**

**5) රූ රුසේ අඳිනා ලෙසේ අත් - ලෙළ දිදී විදුලිය පබා**
**රන් රසේ එක් වන ලෙසේ වෙණ - නාදනූ පා තබ තබා**
**කම්පසේ දෙන සැර ලෙසේ දෙස - බල බලා නෙතගින් සබා**
**මම් කෙසේ පවසම් එසේ වර - සුර ළඳුන් දුන් රඟ සුබා**

සිංහල සාහිත්‍ය ඉතිහාසයෙහි ගම්පොළ යුගයට ඉක්බිති එළඹෙන්නේ කෝට්ටේ යුගය යි. කෝට්ටේ රාජධානියෙහි ප්‍රථම පාලකයා වූයේ vi..වන පැරකුම්බා (ක්‍රි.ව. 1415 1467) රජතුමා ය. මේ රජුගේ කාලයෙහි ලංකාවේ ජාතික, ආගමික සංස්කෘතික, සාහිත්‍යයික හා දේශපාලනික අංශයන්හි විශාල දියුණුවක් ඇති විය. මේ යුගයට වර්ෂ 165 ක පමණ කාලයක් අයත් වේ.

මේ යුගයේ ග්‍රන්ථ කරණයෙහි යෙදුණු ලේඛකයන් අතර භික්ෂු - පැවිදි පක්ෂය ම වූ බව පෙනේ. ශ්‍රී රාහුල හිමි, වීදගම හිමි, වැත්තෑවේ හිමි, ධම්මදින්න හිමි වැනි පැවිදි ලේඛකයෝ ද පැරකුම්බා රජු, නන්නුරුතුනයා වැනි ගෘහස්ථ ලේඛකයෝ ද මෙකල විසූහ. සාහිත්‍යකරණය පිළිබඳ විවිධත්වයක් ද මේ යුගයේ දක්නට ඇත.

# 3. හානා හීය පානා අඩහැරෙන් දැනේ

- **අනුරාධපුර යුගයේ** ලියැවුණු **සංයුත්ත නිකායට්ඨ කථාව** වන **පරමත්ථ ජෝතිකාවේ** එන පාඨයක අදහස මෙසේ ය. මඟ අසබඩ කෙතක් රකිනා සිංහල කාන්තාවක ජාති, ජරා, මරණ ආදිය පිළිබඳව සිංහල බසින් කී ගියක් අසා සඟ සැටනමක් රහත් වූහ. මෙයින් කියැවෙන්නේ ජන කවිය අනුරාධපුර සමය දක්වා ගිය දිගු ඉතිහාසයක් ඇති සාහිත්‍යයක් බවයි.
- ජන කවියට **කතුවරයෙක් නැත.** මේ සාහිත්‍යාංගය කවරකු විසින් හෝ නිර්මාණය කරන ලදු ව, කාලයක් තිස්සේ භාවිත වීමෙන් ජනතාවගේ පොදු අයිතියක් බවට පත්වූවකි.
- **කෘෂිකර්මය ආශ්‍රිත** - ගොයම් කවි, නෙ!ළුම් කවි, කුරක්කන් කවි, පැල් කවි හා කමත් කවි වැනි ජන කවි
- **විවිධ රැකියාවල යෙදෙන්නෝ** - පතල් කවි, ගැල් කවි, බඹර කවි හා පාරු කවි
- **කෙළි සෙල්ලම් ඇසුරෙන්** - ලී කෙළි, ඔළිඳ කෙළි, කල ගෙඩි නැටුම්, ඔංචිලි වාරම් වැනි කවි
- **බලි තොවිල් හා ශාන්තිකර්මවල** - දෙවොල් මඩු, ගම්මඩු හා කෝල්මුර කවි
- නැළවිලි ගී, උපදේශාත්මක කවි, විනෝදය හා ශෘංගාරය මුසු වුණු ජන කවි ,ප්‍රේමය හා ආදරය ප්‍රකාශ කිරීමට කවි ,තේරවිලි කවි.
- ජීවිතයේ දී විඳින්නට සිදු වන අපමණ දුක්ඛ දෝමනස්සයන්, බලාපොරොත්තු කඩවීම්, අනපේක්ෂිත ව්‍යසනයන්ට පත්වීම් වැනි දුක්බර අවස්ථා ද උපත, රංකිරි කටගෑම, ගුරු ගෙදර යාම, වැඩිවිය පැමිණීම, විවාහය හා මරණය වැනි ජීවිතයේ විවිධ අවස්ථා ද ජන කවියට **වස්තු විෂයය** විය.
- සිංහල ජන කවිය තුළ දැකිය හැකි **විශේෂ ලක්ෂණ** කිපයකි. එදිනෙදා ජීවිතය හා බැඳුණු සිදුවීම් හා හැඟීම් අන්තර්ගතය වීම.සරල උපමා හා රූපක ආදියෙන් රසවත් වීම.ගැමි ජනතාවගේ නිර්මාණයක් වීම.,සරල භාෂාවක් භාවිත කිරීම.,මුඛ පරම්පරාවෙන් පැවත ඒම.
- භාව පූර්ණ වාග්මාලාව ජන කවියාට සහජයෙන් උරුම වූවකි.
- **දැනමුතුකමට කී කවි** හෙවත් **උපදෙස් දීම සඳහා කී කවි** ගණයේ ලා සැලකෙන ජන කවි කිපයක් මෙහි දැක්වේ.
- මේ උපදෙස් කවි සෑම දේශයකට ම ඔබින, සෑම කාලයකට ම ගැළපෙන ඒවා ය. ඕනෑ ම තරාතිරමක, ඕනෑ ම වයසක පසු වන කෙනෙකුගේ ජීවිතය හැඩ ගස්වා ගැනීමට ඒවායින් ලබා දෙන උපදෙස්, උපකාර වේ.
- නිර්දිෂ්ට ජනකවි පෙළෙහි ගැබ්වූ උපදේශ / උපදේශ ඉදිරිපත් කිරීම සඳහා භාෂාව නිර්මාණාත්මක ව යොදාගෙන ඇති ආකාරය **විචාරයේ යෙදීම.**

1) ගසට කෙටුම ගස මුල පැයුමෙන් දැනේ
මිනිහා නොමිනිහා යන කඩිසරෙන් දැනේ
අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දැනේ
හානා හීය පානා අඩහැරෙන් දැනේ

2) ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු
බොරුල්ලේ තරම දැනගෙන උඩ පනිනු
කඩුල්ලේ තරම දැනගෙන කඳ බඳිනු
තමුන්ගේ තරම දැනගෙන කල් හරිනු

3) ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද
දත නැති දා උක් දුන් ගිනි තපින්ට ද
වෙර නැති දා ගහගත්තේ දින්නට ද
යුද ඇති දා නැති කග කොස් කොටන්ට ද

4) රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
මිණි බරණින් සැදු මුත් ගත නොදිරද්ද
පැණිවරකා ගසටත් හෙණ නොවදිද්ද

5) අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙලා
අනුන් ලියන් දැක තම ලියට තල තලා
දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා

# 4)බැද්දේගම (කොළඹ / නූතන යුගය)

- **1880** වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින **ලන්ඩනයේ කෙන්සිටන් (Kensington)** නුවර, දරුවන් දස දෙනකුගෙ න් යුතු පවුලක තුන්වැනියා ව **ලෙනාඩ් සිඩ්නි වුල්ෆ්** දරුවා උපත ලැබී ය.
- ලන්ඩන්හි **ශාන්ත පාවුලු විද්‍යාලය, කේම්බ්‍රිජ්හි ට්‍රිනිටි විද්‍යාලය** යන විද්‍යාලවලින් මූලික අධ්‍යාපනය ලද ඔහු **1902** වර්ෂයේ දී උපාධිය හිමි කර ගත්තේ ය.
- **1904** ඔක්තෝබර් මස ලංකාවට පැමිණි වුල්ෆ් මහතා මුලින් ම **යාපනය** ප්‍රදේශයේ **සිවිල් නිලධාරියකු** ලෙස සිය රාජකාරිය ආරම්භ කළේ ය.
- අනතුරු ව **නුවර** ප්‍රදේශයේ ද රාජකාරි කළ එතුමා **1908** දී ආණ්ඩුවේ **සහකාර ඒජන්තවරයා** ලෙස **දකුණු පළාතේ** රාජකාරි භාර ගත්තේ ය.
- වුල්ෆ් මහතාගේ පාලන දිස්ත්‍රික්කය වූයේ **හම්බන්තොටයි.**
- **1911** දී එතුමා නැවත එංගලන්තයට ගොස් **1912** දී **ඇඩ්ලින් වර්ජිනියා ස්ටෙෆන් (Adline Virginia Stephen)** මෙනෙවිය සමග විවාහ විය.
- වුල්ෆ් මහතා ලංකාවේ දී තමා ලත් අත්දැකීම් පාදක කර ගෙන **1913** දී අපූරු නවකතාවක් ලිව්වේ ය. ඒ **විලේජ් ඉන් ද ජංගල් (Village in the Jungle)** නම් කෘතියයි. දුප්පත් අහිංසක අසරණ ගැමියාගේ දුඃඛිත භාවය හා කුටෝපක්‍රමවලට හසු වී ක්‍රමයෙන් විනාශ වන ඔවුන්ගේ ජීවිත සිළිඳු හා ඔහුගේ පවුල ඇසුරෙන් ප්‍රතිනිර්මාණය කරන්නට ගත් උත්සාහයක් ලෙස එය හැඳින්විය හැකි ය. වරෙක සුන්දර ව දිස් වන මහ වනය නිරන්තරයෙන් ම බියකරු බව ම රුදෙන අමුතු ම තැනක් ලෙස එම නවකතාවෙන් හෙළිදරව් කෙරේ.
- **1960** දී නැවත ශ්‍රී ලංකාවට පැමිණි වුල්ෆ් මහතා මෙරට වැසියන් විසින් උණුසුම් ලෙස පිළිගනු ලැබීමත් ඔවුන්ට එතරම් කාලයක් තමා ගැන මතක තිබීමත් පිළිබ!ඳව පුදුමයට පත් වන බව පවසා ඇත.
- ඔහු **1969 අගෝස්තු මස 14** වැනි දින **එංගලන්තයේ රොඩ්මෙල්හි දී (Rodmell)** මෙලොවින් සමු ගත්තේ ය. **'Monk's house'** නම් ස්ථානයේ එතුමා වෙනුවෙන් තැනුණු **ලෝකඩ ස්මාරකය** වෙයි.
- මෙම නවකතාව **බැද්දේගම** නමින් සිංහලයට අනුවර්තනය කළේ, ප්‍රවීණ ගත් කතුවරයකු වූ **ඒ. පී. ගුණරත්න** මහතා ය.
- කතා රුසක් සිංහලයට නගා සිංහල පාඨකයා අතර ජනප්‍රිය වූ ගුණරත්න මහතා, චූ වෙං එන් විසින් රචිත 'Te Monkey' නමැති ග්‍රන්ථය **වානරයා** නමින් ද ආර්. එල්. ස්පිට්ල් විසින් රචිත 'Savage Sanctuary' නම් ග්‍රන්ථය **වන සරණ** නමින් ද, 'Vanished Trails' නමැති ග්‍රන්ථය **මැකී ගිය දඩමං** නමින් ද 'Where the white Sambhur roams' ග්‍රන්ථය **සුදු ගෝනා** නමින් ද පරිවර්තනය කළේ ය.
- මෙහි බැද්දේගම නවකතාවේ **නමවෙනි පරිච්ඡේදය** ඇතුළත් වේ.
- කතා ප්‍රවෘත්තිය/ දෘෂ්ටි කෝණය/ චරිත නිරූපණය/ අවස්ථා හා සිද්ධි නිරූපණය/ පසුබිම් නිරූපණය/ නිර්මාණාත්මක භාෂා ලක්ෂණ **විචාරයේ යෙදීම.**

**1) කුඩා කල සිළිඳු කී වනයෙහි මං මුළා වූ දඩයක්කාරයින්ගේ කතා ඇට සිහි විය. ඔවුන් එදා බියවන්ට ඇත්තේ ද අද තමාට ඇති වී තිබෙන බිය වැනි බියකිනැයි ඇට සිතිණ.**

**2) තිරිත දිග තද සුළඟට ඇඹරවී ඇවුවන් බැහී ගිය ගහක් මෙන් ඇගේ ශරීරය ද නැමී ඇඹරී තිබිණ. මුහුණේත් සිහින් ව ගිය අත්පාවලත් සම ගසක පොත්තක් මෙන් ගොරහැඩි ව රැලි වැටී ඇටයට ඇලී ගියේ ය.**

**3) ආරච්චිගේ ගෙය කැලයට යාම කැලය ගම මැදට කඩා පැනීමක් මෙන් විය.**

**4) පිස්සු වැද්දා කොටියෙකැ යි කියන්නට පුරුදු වී සිටි ගම්මු පුංචිමැණිකා ගැන කීවේ, කොටියගෙ පැටියා මුවෙක් වෙලා කියා ය.**

**5) හිරපල්ලා තම කතාවෙන් බලාපොරොත්තු වූයේ හිස අත් බදා ගෙන කෑ ගසන ගැහැනියකගේ විලාපයකි. එහෙත් පුංචිමැ,කා නිශ්ශබ්දව ම එතැනින් ගොස් නැවතත් බිත්තිය අද්දර ඇන තියා ගැනීම ඔහුගේ මවිතයට හේතු විය.**

**6) අයියා දැන් කීවානේ මගෙ මිනිහා දන්නවයි කියලා. ඉතින් මට කීවට ඇති වැරැද්ද මොකක් ද? එයා දැන් මෙහෙ ඉන්නවා ද? එයාට මොකද උණේ? දවස් ගානක් තිස්සේ මං මෙහාට ආවෙ මේක දැනගන්ඩ.**

**7) පුංචිමැ,කා, බබුන් එනතුරු මග බලා සිටියා ය. ගත වන දවස් ගණන ඇට ගණන් ගත නො හැකි විය. ඇ ඒ ගැන උත්සාහයක් ද නො කළා ය. සතියක් ඇට ගණනක් පමණකි.**

# 5. මුනි සිරිපා සිඹිමින්නේ (කොළඹ යුගය / නූතන යුගය)

- **1901 ටිබෙට් රටෙහි සිකීම් දේශයේ** උපන් මහින්ද හිමි **ඇස්.කේ. තෂි නම්ගයාල්** ලෙසමුල දී හඳුන්වා ඇත.
- වයස අවුරුදු **දොළහේ දී** පමණ සිය පැවිදි සොහොයුරා වූ **එස්.පුණ්ණජී හිමියන්** සහ **ජර්මන් ජාතිකඤාණතිලෝක හිමියන්** සමග කුඩා තෂි ලංකාවට පැමිණි ඇත.
- මුලින් ම **පොල්ගස්දූව ආරාමයේ** නැවතී, කොළඹ **විද්‍යෝදය පිරිවෙනට** බැඳී ඉගෙනීමටත්එම කාලයේ **ම මරදානේ මහාබෝධි විද්‍යාලයෙන්** ඉංග්‍රීසි ඉගෙනීමටත් ඔහු යොමු විඇත.
- තෂි නම්ගයාල්, එස්. මහින්ද හිමි ලෙස පැවිදි බව ලබන්නේ **රත්ගම සිරි චූලසුමනහිමියන්** වෙතිනි. මෙලෙස **අමරපුර** නිකායේ පැවිදි ව **දොඩන්දූවේ ශෛලබිම්බාරාමයෙහිවැඩ** වෙසෙමින් මහින්ද සාමණේර හිමියෝ සිය අධ්‍යාපන කටයුතු කරගෙන ගියහ.
- පසුව උන් වහන්සේ කොළඹ කොම්පඤ්ඤ වීදියේ **සෞගත ආවාසය** වෙත පැමිණියහ.ඒ **1930** වර්ෂයේ ය. එහි දී උන් වහන්සේ පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන් අධිපති **ලුණුපොකුණේ ශ්‍රී ධම්මානන්ද හිමියන්** වෙත යළි පැවිදි වූයේ **සියම්** නිකායේ භික්ෂුවකහැටියට ය. මහින්ද හිමියන් උපසම්පදා වී ඇත්තේ **1931** වර්ෂයේ ය
- **1934-1936** කාල වකවානුව තුළ එස්. මහින්ද හිමියෝ කොළඹ **ආනන්ද විද්‍යාලයේ** ආචාර්යවරයකු ලෙස සේවය කළෝ ය. එහි දී උන් වහන්සේ **සිංහල, පාලි, බුද්ධ ධර්මය** විෂය ඉගැන්වීම් කටයුතු සිදු කර ඇත. .
- එස්. මහින්ද හිමියන් **1936** වර්ෂයේ සිට වැඩ වාසයකර ඇත්තේ **පානදුරේ මහබෙල්ලන ශ්‍රී සුදර්ශනාරාමයේ** ය. එහි වසර **15**ක් පමණ වැඩවෙසෙමින් විවිධ සමාජ ආගමික සාහිත්‍ය සේවාවන් සිදු කරමින් සිටිය දී **1951 මාර්තු 16** දා මේ උද්යෝගිමත් බුද්ධපුත්‍රයන් වහන්සේ හදිසියේ අපවත් වූහ.
- උන් වහන්සේගේ සාහිත්‍ය කටයුතු බෙහෙවින් ම කවියට නැඹුරු විය. එම කවි ප්‍රධාන තේමා තුනක් යටතේ අපට හඳුනා ගත හැකි ය.
  1. ළමයින් උදෙසා ලියූ කවි - **ඔවා මුතු, කව්මිණි, කව්මුතු, ළමා කවි කලඹ, නන්දන ගීත**
  2. දේශානුරාග හා ජාතිකාභිමාන කවි - **නිදහසේ දැහැන, නිදහසේ මන්ත්‍රය, ලංකාමාතා**
  3. බුද්ධාභිවන්දනා කවි - **රත්නමාලි**
- **ඔවා මුතු** උන් වහන්සේ ලියූ මුල් ම කාව්‍ය කෘතිය යි.
- මෙම පාඩමට පාදක වන **දරු නැළවිල්ල හෙවත් ජාතික නොවිල්ල** නමැති දීර්ඝ කාව්‍ය පන්තිය ජාතික වීර කාව්‍යයක් බවට පත් ව තිබේ. මෙය ළමයින් අරමුණු කර ගෙන මුළු මහත් ජාතිය ම අමතන කාව්‍යයකි.
- ජාතික නොවිල්ල පද්‍ය පන්තිය රචනා වීම පිළිබඳ **පසුබිම් කතාව** ද අපූර්ව එකකි.
- **පල්ලේගම කෝලාන ගමේ වෙල් යායේ දී** ඇරඹි මේ කවි පෙළ පසු දා **සුමනාරාමයේ දී** ම ලියා අවසන් කෙරිණ.
- කවියාගේ අරමුණ/කාව්‍යානුභූතිය/කාව්‍යමය භාෂාව/ඖචිත්‍ය ගුණය/සංකල්ප රූප මැවීම/සිව්පද ආකෘතිය භාවිත කිරීම./දේශාභිමානී හැඟීම් දැනවීම. **විචාරයේ යෙදීම.**

1. නිදහස මහ මුහුදක් වේ
   එහි උල්පත පුත, නුඹ වේ
   ඒ බව සිහි කොට මෙ ලොවේ
   යුතුකම ඉටු කළ යුතු වේ

2. කරදර දහසක් හමුවී
   ඉන්ටැකි නම් සිනා වෙවී
   ඔහු මෙලොවට පහළ දෙවී
   රජෙකැයි සලකනු මැනවී

3. ජාතිය රන් විමනක් වේ
   ආගම මිණි පහනක් වේ
   එය රැක ගන්නට මෙ ලොවේ
   සමත් වෙතොත් පුත නුඹ වේ

4. මිතුරුකමින් පෙරට එතොත්
   දූවිල්ලක් එක්ක වුණත්
   මිතුරු වෙයන් පුතේ උඹත්
   එයයි ලොවේ ගුණය මහත්

# 6) ගංගාවේ සංගීතය (කොළඹ යුගය / නූතන යුගය)

- හේවාවසම් මුනිදාස කුඩලිගම හෙවත් **එච්. එම්. කුඩලිගම** කොළඹ යුගයේ කවියෙකි.
- වර්ෂ **1918** දී කළුතර කුඩලිගම දී උපත ලැබූ එච්. එම්. කුඩලිගම **මිෂනාරි පාසලෙන්** ජ්‍යේෂ්ඨ පන්තිය තෙක් ඉගෙනුම ලැබුවේ ය.
- ඉන් අනතුරුව ධර්ම විජය පිරිවෙනෙන් උසස් අධ්‍යාපනය ලැබුවේ ය.
- **සිංහල බලය, දිනමිණ, සිළුමිණ** හා ජනතා ආදි පුවත්පත්වල සේවය කළ ඔහු කලක් **සුවඳ** කවි සඟරාව ද සංස්කරණය කළේ ය.
- **පාලි සංස්කෘත** භාෂා පිළිබඳ දැනුම ද ඔහු සතු වුවත් බොහෝ විට ව්‍යවහාරයට සමීප කටවහරට ළං වූ බසක් ඔහු භාවිත කළේ ය.
- ස්වභාව සෞන්දර්යය හා බැඳුණු කවි ආර හේතුවෙන් **සිංහල ෂෙලි** ලෙස කුඩලිගම ප්‍රකට වුව ද බටහිර කවියකු වූ ෂෙලිගේ කවි ඔහු කියවා නොතිබිණි.
- එච්.එම්. කුඩලිගම කවියා **තාගෝර්** කිවිඳුන්ගේ නිර්මාණවලට සමීප වූ අන්දමත්, ඒවායෙහි ආභාසය ලැබූ අවස්ථාත් සිහි පත් කර ඇත.
- **මීමන ප්‍රේමතිලක, උපනන්ද බටුගෙදර** ආදීහු ඔහුට සමකාලීන කවිහු වෙති.
- **සුවඳ, දේදුන්න, මීවදය** වැනි කවි සඟරාවල ද එකල පැවති පුවත්පත්වල ද එච්. එම්. කුඩලිගමගේ කවි නිරන්තරයෙන් පළ විය.
- **ඈ ,කුණාටුව, එකෝමත් එක රටක, සංවාදය** වැනි කෘති ඔහුගේ කාව්‍ය ග්‍රන්ථ අතර වේ.
- **මනුෂ්‍ය ජීවිතය, සොබා දහම හා ප්‍රේමය** පිළිබඳ අපූර්ව අත්දැකීම් සිය නිර්මාණ මගින් මතු කිරීමට සමත් වූ සංවේදී කවියකු වශයෙන් සිංහල කාව්‍ය වංශයෙහි නොමැකෙන නමක් සටහන් කළ කුඩලිගම කවියා **1973 අගෝස්තු 01** දා අභාවප්‍රාප්ත විය.
- **ලෝ දහම පිළිබඳ එළි දහරක් විටින් විට විහිදුවන** ගංගාවේ සංගීතය නමැති, කුඩලිගම කවියාගේ පැදි පෙළ මේ පාඩමෙන් ඉදිරිපත් කෙරේ.
- අරමුණ/කාව්‍යානුභූතිය/භාෂාව/ඖචිත්‍ය ගුණය/සංකල්ප රූප මැවීම/ධ්වනිතාර්ථවත් බව **විචාරයේ යෙදීම.**

**1) කඳු බැවුමක දං බෝවිටි පඳුරු තලා**
**පහළට ඇදී පර මල් පෙති ඉවත නොලා**
**කලදෝ දියෙන් පොඟවා රන් පුලින තලා**
**සංගීතවත් වී යමි ඉදිරියට ගලා**

**2) හිරිමල් සිනා රැළි පෙණ පිඩු මිහිරි තම**
**ගල් පරවල ම හැපි හැපි බිහි කරමි මම**
**සම තැනිතලාවල හමු වෙයි අලස කම**
**නිරසයි අතරමග අවහිර තුඩුවු බිම**

**3) එන්නේ කොහි සිට ද කොතැනකට ද යන්නේ**
**ඔබ කුමකට ද මා දුටු තැන විමසන්නේ**
**මිනිසුන් ගිහින් නිතර ම ආපසු එන්නේ**
**කිම දැ යි කියා කිසිවකු ඇයි නොසොයන් නේ**

**4) රන් තරු පිරිවරා ගත් සඳ මඩල යට**
**මහ වන බිමක් මැද ගිරි කුළු අතර සිට**
**නොමියන හේලි දහමක පණිවුඩය පිට**
**කොඳුරමි කෙදිරියක් මුළු ලොව තිසල කොට**

- නූතන සිංහල සාහිත්‍යයේ පුරෝගාමීන් ලෙස සැලකෙන්නෝ **පියදාස සිරිසේන, ඩබ්ලියු.ඒ. සිල්වා, කුමාරතුංග මුනිදාස, රූපියෙල් තෙන්නකෝන්, මාර්ටින් වික්‍රමසිංහ, මහගමසේකර, ජී.බී. සේනානායක, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර** ආදීහු ය. ඔවුහු සම්භාව්‍ය සාහිත්‍යයෙන් සහ විශ්ව සාහිත්‍යයෙන් ආභාසය ලබමින් නූතන සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රය පෝෂණය කළහ. ඔවුන්ගේ ආභාසය ලබමින්, ලෝකයේ නව සාහිත්‍ය ප්‍රවණතා ගවේෂණය කරමින් නූතන සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයට එක් වූ ලේඛකයෝ බොහෝ වෙති. වර්තමාන සිංහල සාහිත්‍යය මේ සියල්ල ඇසුරේ නිර්මාණය වෙයි.

# 7) ලෙන අතහැර යෑම (කොළඹ / නූතන යුගය)

- **සිංහබාහු** නාට්‍යය මහාචාර්ය **එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ** නිර්මාණයකි.
- එය වර්ෂ **1961** අගෝස්තු මස **31** වැනි දින ප්‍රථම වරට **පේරාදෙණියේ දී** රංගගත විය.
- ඔහු වර්ෂ **1914** ජූනි 03 දින දකුණු පළාතේ **රත්ගම දොඩන්දූව** ගමෙහි ජන්ම ලාභය ලැබිය.
- ඔහුගේ පියා **චාල්ස් ප්‍රැන්සිස් ද සිල්වා ය.** මව **ලීඩියා පින්තු** ය.
- දෙමවුපියෝ දරුවාට **යුස්ටස් රෙජිනෝල්ඩ් ද සිල්වා** යනුවෙන් නම් තැබූහ.
- පියා **තැපැල් ස්ථානාධිපතිවරයකු** ලෙස විවිධ පළාත් වෙත ස්ථාන මාරු ලද හෙයින් පාසල් කිහිපයක ම අධ්‍යාපනය හදාරන්නට රෙජිනෝල්ඩ් හට සිදු විය. ඒ **ගාල්ල සවුත්ලන්ඩ් විද්‍යාලය, ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය, ගාල්ල ශාන්ත ඇලෝසියස් විද්‍යාලය, පානදුරේ ශාන්ත ජෝන් විද්‍යාලය, ගල්කිස්ස සාන්ත තෝමස් විද්‍යාලය** යනාදි වශයෙනි.
- පාසල් අධ්‍යාපනයෙන් අනතුරු ව එවක කොළඹ **යුනිවර්සිටි කොලීජියට** ඇතුළු වූ රෙජිනෝල්ඩ් තරුණයා **1936** දී සරසවියෙන් පිට වූයේ **ගෞරව උපාධියක්** සහිත ව ය.
- ඉංගිරිසි භාෂාවෙහි ද නිපුණ වූ හෙතෙම **සිලෝන් ඩේලි නිවුස්** පුවත්පතට එක් විය.
- **1939** වර්ෂයේ දී **රවීන්ද්‍රනාත් තාගෝර්ගේ ශාන්ති නිකේතන සරසවිය** වෙත ගියේ, **භාරතීය දර්ශනය** සහ **සංගීතය** ආදි නොයෙක් විෂයයන් හදාරා නැවත මවුබිමට පැමිණියේ ය.
- කෙටි කලක් ගල්කිස්ස **ශාන්ත තෝමස් විදුහලේ ගුරුවරයකු** ලෙෂ සේවය කර, **කථිකාචාර්යවරයකු ලෙස විශ්වවිද්‍යාල** සේවයට එක් වූ හෙතෙම පසු ව, **ලන්ඩන් විශ්වවිද්‍යාලයේ** බාහිර අපේක්ෂකයකු වී **පෙරදිග දර්ශනය පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය** හිමි කර ගත්තේ, **පේරාදෙණිය විශ්වවිද්‍යාලයට** එක් වී **පෙරදිග භාෂා පීඨයේ පාලි සහ බෞද්ධ දර්ශනය පිළිබඳ කථිකාචාර්ය** ධුරයට පත් වූයේ ය.
- මෙකල තමා ජන්මයෙන් ලැබ සිටි විදේශීය උරුවේ නම වෙනුවට **වැදිතන්ත්‍රිගේ එදිරිවීර සරච්චන්ද්‍ර** යන නම භාවිතයට ගත් එතුමා එවකට පුවත්පත් සඳහා **සරච්චන්ද්‍ර** නමින් ලිපි සම්පාදනයේ යෙදුණේ ය.
- එතුමා ග්‍රන්ථ බොහෝ ගණනක් රචනා කළේ ය.

  1) නාට්‍ය කෘති - **මනමේ, සිංහබාහු, පේමතෝ ජායතී සෝකෝ, පබාවතී**
  2) නවකතා - **මළගිය ඇත්තෝ, මළවුන්ගේ අවුරුදු දා**
  3) විචාර පර්යේෂණ ග්‍රන්ථ - **කල්පනා ලෝකය, සාහිත්‍ය විද්‍යාව**
  4) ස්වයං ලිඛිත චරිතාපදානය - **පිං ඇති සරසවි වරමක් දෙන්නේ**

- එදිරිවීර සරච්චන්ද්‍රයෝ භාරතයේ **කුමාරන් අශාන් විශ්ව** සම්මානයෙන් ද, පිලිපීනයේ **රැමොන් මැග්සෙසයි** සම්මානයෙන් ද ජපානයේ **ස්වර්ණ රජත** සම්මානයෙන් ද පිදුම් ලැබූහ.
- එතුමාගේ නාට්‍ය අතර **ශෛලිගත** සම්ප්‍රදායේ **සිංහබාහු** නාට්‍යය මුල් තැන්හි ලා සැලකිය හැකි ය. මෙහි තේමාත්මක කතා පුවත **මහාවංශයෙහි සඳහන් සිංහල ජාතිය බිහි වීම** පිළිබඳ කතා පුවතයි.
- නාට්‍යයක අත්‍යවශ්‍ය ම අංගයක් වන **ගැටුම** ඉතා ප්‍රබල ව මෙහි නිරූපණය වේ. **ගතානුගතිකත්වය සහ නූතනත්වය අතර වන සදාකාලික ප්‍රතිවිරෝධය** මේ නළුවෙහි යටි පෙළ සේ දිවෙන බව විචාරක මතයකි.
- සිංහබාහු නාට්‍යයේ **ලෙන අතහැර යෑම** නමැති **දෙවන අංකය** මේ පාඩමට ඇතුළත් වේ.
- නාට්‍යෝචිත අවස්ථා/කාව්‍යෝපක්‍රම භාවිතය/ගීතවත් බස් වහර/චරිත නිරූපණය/සිද්ධි සහ පසුබිම් නිරූපණය **විචාරයේ යෙදීම.**

**1) ප්‍රේමවන්ත දරුවෙනි මා, හිඳිනු කන් යොමා, කියම් පුවත සැක දුරැරා, අසන නිතියෙනා.**

**2) කිම් ද මෑණියනි, ඔබ මේ පවසන වදනා, ඇස් කන් ඇදහිය නොහේ ය, ඇසෙන මෙ අරුමා.**

**3) මේ සියල්ල හැරදා, මම ආවෙම් වලටා, වෙසෙන ලෙසා ඔබ පිය මා, සමිඳුන් සමගා.**

**4) ඔබ පියාණෝ නරයෙකු නො ව වනයෙහි දී මට හමු වූ සිංහ රාජයෙකි. ඔහු කෙරෙහි ඇති වූ ප්‍රේමය නිසා මම රාජ සැප හැර දමා මේ වනයෙහි වෙසෙමි, දරුවෙනි.**

**5) මේ ලෙනෙන් ඔබ දෙදෙන මා සමග යා යුතු ය වන වාසෙ හැර දමා නර වාසෙ සොයමිනා.**

**6) තුමුල ගතින් දා, බාහු බෙලෙන් දා, වෙම් සේ තිඳසින් දා, කුරිරු ගිජින්දා, කුඹු තල සින්දා, ළම් සේ කෙසරින්දා, මා පිය මිගිඳා කරනා විකුමන්, ඇයි මට බැරි වන්නේ.**